# ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කාර්ය සාධන ඇගයීමක්: ජාතික මත විමසුම



සෝෂල් ඉන්ඩිකේටර්: විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

Friedrich Naumann Foundation for Freedom (FNF) Sri Lanka

2021 නොවැම්බර්

# හැඳින්වීම

ජනාධිපතිවරණ සහ පාර්ලිමේන්තු මැතිවරණ ජයග්‍රහණය රාජපක්ෂවරුන්ට පාර්ලිමේන්තුවේ විශාල බහුතරයක් ලබා ගැනීමටත්, පසුගිය පාලනය විසින් ගෙන ආ ප්‍රතිසංස්කරණ ආපසු හැරවීමටත් මග පාදන ලදී. වර්ෂ 2020 ඔක්තෝම්බර් 22 දින නීතියක් වශයෙන් සම්මත කරන ලද 20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් විධායකයට පුළුල් බලතල ලබා දුන් අතර එමගින් රට තුළ පරිහානියට පත් වෙමින් පවතින ප්‍රජාතන්ත්‍රවාදී අවකාශය තවදුරටත් අනතුරට පත් විය. එපමණක් නොව, කොවිඩ් වසංගත තත්ත්වය සහ එහි සීමාවන් හරහා පවතින පාලන තන්ත්‍රයට ස්වකීය ඒකාධිපති පාලනය අඛණ්ඩව කරගෙන යාමටත්, සිවිල් අවකාශයන් තුළ දැඩි මිලිටරිකරණයකින් යුක්තව සිය පාලනය පවත්වාගෙන යාමටත් ඉඩ ප්‍රස්ථාව ලැබී ඇත.

මෙම සමීක්ෂණය සිදු කරනු ලැබුවේ තවදුරටත් ව්‍යවස්ථාමය වෙනසක් සඳහා වන රජයේ සැලසුම් පවතින සන්දර්භයක ය. වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, දේශපාලන ක්‍රමයේ ස්වභාවය, ජනාධිපති ධූරය, ආර්ථිකයේ ස්වභාවය, මානව හිමිකම් පිළිබඳ තත්ත්වය සහ අධිකරණය ආදී ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් සාමාන්‍ය ජනතාවගේ දැනුම, ආකල්ප සහ සංජානනයන් ඇගයීමට ලක් කිරීම මෙම දීප ව්‍යාප්ත සමීක්ෂණයේ අරමුණ විය.

මෙම සමීක්ෂණය පවත්වන ලද්දේ වර්ෂ 1999 සිට ශ්‍රී ලංකාවේ පුළුල් පරාසයක සමාජ-දේශපාලනික ගැටළු පිළිබඳව මහජන මත විමසුම් පවත්වනු ලබන විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙහි සමීක්ෂණ පර්යේෂණ අංශය වන සෝෂල් ඉන්ඩිකේටර් මගිනි. ආචාර්ය ප්‍රදීප් පීරිස්, සකිනා මොයිනුඩීන් සහ එම්. ක්‍රිෂ්ණමූර්ති යන අයගෙන් මෙම සමීක්ෂණ කණ්ඩායම සමන්විත විය. මේ ආකාරයේ අධ්‍යයනයක් මෙරට තුළ සිදු කිරීම සඳහා ලබා දුන් සහයෝගය සම්බන්ධයෙන් ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු (විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය) සහ Friedrich Naumann Foundation for Freedom (FNF) Sri Lanka වැඩසටහනෙහි හියුබර්ටස් වොන් වෙල්ක් (Hubertus von Welck) සහ එකී කණ්ඩායම සඳහා සෝෂල් ඉන්ඩිකේටර් සවකීය ස්තුතිය පුද කරනු ලැබේ.

# ක්‍රමවේදය

දිවයිනේ දිස්ත්‍රික්ක 25 ම ආවරණය වන පරිදි ප්‍රධාන ජනවාර්ගික ප්‍රජාවන් හතරෙන් (සිංහල, දෙමළ, උඩරට දෙමළ සහ මුස්ලිම්) සැදුම්ලත් නියැදියක් ඔස්සේ ප්‍රතිචාර දැක්වූවන් 936ක් සමඟ අර්ධ ව්‍යුහගත ප්‍රශ්නාවලියක් භාවිතයෙන් මුහුණට මුහුණ සම්මුඛ සාකච්ඡා සිදු කිරීම මගින් මෙම සමීක්ෂණය සිදු කරන ලදී. දිස්ත්‍රික් සහ ජනවාර්ගිකත්වය සැලකිල්ලට ගනිමින් නියැදිය තෝරා ගැනීම සිදු කරන ලදී. ප්‍රතිචාරකයන් තෝරා ගැනීම සඳහා අහඹු නියැදී අනුග මනය කිරීමේ ක්‍රම භාවිතා කරන ලදී.

සමස්ත අධ්‍යයනය සම්බන්ධයෙන් වූ ක්ෂේත්‍ර කටයුතු වර්ෂ 2021 අප්‍රේල් 25 සිට ජූලි 31 දක්වා වූ කාල පරාසය තුළ පවත්වන ලදී. මෙම අධ්‍යයනය සඳහා සිංහල, දෙමළ සහ මුස්ලිම් යන ප්‍රධාන ජනවාර්ගික ප්‍රජාවන් ත්‍රිත්වය නියෝජනය කරන ලද පිරිමි සහ ගැහැණු යන දෙඅංශයෙන්ම ක්ෂේත්‍ර පර්යේෂකයන් 66 දෙනෙක් සහභාගී වූහ. ප්‍රතිචාර දැක්වූවන්ගේ සහ අදාළ ක්ෂේත්‍ර පර්යේෂකයන්ගේ මව් භාෂාවන්ගෙන් සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී.

පවතින කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් උද්ගත වූ සීමාවන් සැලකිල්ලට භාජනය කරමින් ක්ෂේත්‍ර අධීක්ෂකවරුන් සඳහා ක්ෂේත්‍ර කටයුතු පිළිබඳ දැනුම්වත් කිරීම zoom ක්‍රමවේදය හරහා මාර්ගගතව සිදු කරන ලදී. සෝෂල් ඉන්ඩිකේටර් හි පර්යේෂකයන්ගේ මාර්ගගත අධීක්ෂණ යටතේ ජ්‍යෙෂ්ඨ ක්ෂේත්‍ර අධීක්ෂකවරුන් විසින් ඔවුනොවුන්ගේ දිස්ත්‍රික්කවල ක්ෂේත්‍ර සමීක්ෂකයන් හට මුහුණට මුහුණ පුහුණු කිරීම් කටයුතු සිදු කරන ලදී. සෑම පුහුණු සැසියකටම උපරිම වශයෙන් ක්ෂේත්‍ර සමීක්ෂකයන් තිදෙනෙකු සහභාගී විය.

ක්ෂේත්‍ර කටයුතු ආරම්භ කිරීමට පෙර අධ්‍යයනය, පර්යේෂණ මෙවලම් සහ ක්ෂේත්‍ර ශිල්පීය ක්‍රම පිළිබඳ පුළුල් පුහුණුවක් අදාළ ක්ෂේත්‍ර පර්යේෂකයන් වෙත ලබා දෙන ලදී. එක් රැස් කරන ලද දත්තවල ගුණාත්මක භාවය සහතික කිරීම උදෙසා - ප්‍රතිචාරකයන්ගේ මුළු නියැදියෙන් අවම වශයෙන් 10% ක් තත්ත්ව පරීක්ෂාවට ලක් කරන ලදී. ජනගහනයේ සැබෑ දිස්ත්‍රික්කය සහ ජනවාර්ගික අනුපාතය පිළිබිඹු කිරීම සඳහා දත්ත කට්ටලය බර තැබීමට ලක් කර ඇත. සමාජ විද්‍යාව සඳහා වන සංඛ්‍යාන පැකේජය (Statistical Package for Social Sciences-SPSS) භාවිතයෙන් දත්ත කට්ටලය විශ්ලේෂණයට බඳුන් කරන ලදී.

# විධායක සාරාංශය

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය සම්බන්ධයෙන් ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 44%ක් පමණ ප්‍රමාණයක් පවසන්නේ වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අවශ්‍ය වෙනස්කම් සිදුකොට එය ඉදිරියට පවත්වා ගෙන යා යුතු බව වන අතර, ප්‍රතිචාර දැක්වූවන්ගෙන් ආසන්න වශයෙන් 35%ක් පෙන්වා දෙනු ලබන්නේ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අවශ්‍ය වන බවයි.
- සමස්තයක් වශයෙන්, නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හෝ ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රතිචාර දක්වන්නන් විසින් අපේක්ෂා කරනු ලබන ප්‍රධාන සාධක ත්‍රිත්වය නම්, එමගින් සැමට ආර්ථික සෞභාග්‍යය සහතික කිරීම (48.1%), ජාතික ආරක්ෂාව සහතික කිරීම/ශක්තිමත් කිරීම (24.4%) සහ ඒ ඔස්සේ බහුත්වවාදී සමාජයක පැවැත්ම (11%) සහතික කරනු ලැබීමයි.
- නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම පිළිබඳ තොරතුරු සන්නිවේදනය කිරීම සම්බන්ධයෙන් ගත් කළ රජය තරමක් දුරට සාර්ථක වී ඇති බවට ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 37.3% ක් ප්‍රකාශ කරනු ලබන අතර - 36% කට ආසන්න ප්‍රමාණයක් පවසනු ලබන්නේ රජය ඒ සම්බන්ධයෙන් සාර්ථක වී නොමැති බවයි.
- මැතිවරණ හරහා තෝරා පත්කර ගැනීමේ මූලධර්මයකට (97.6%) අතිමහත් සහයෝගයක් ඇති නමුදු, පාර්ලිමේන්තුවෙන් විමසීමකින් තොරව හා මැතිවරණ පිළිබඳ සැලකිලිමත්භාවයකින් තොරව පාලනය කිරීමට සහ තීරණ ගැනීමට හැකි නායකත්වයක් සහිත විධායක පාලන ක්‍රමයක් සඳහා සැලකිය යුතු ජනතා සහයෝගයක් ඇති බව ප්‍රතිචාර දැක්වූවන්ගෙන් බහුතරයකගේ මතය අනුව එය විද්‍යමාන වේ.
- ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන ආකාරය සම්බන්ධයෙන් සෑහීමකට පත්වන බව ප්‍රතිචාරකයන් බහුතරයක් (53.9%)  පෙන්නුම් කළද, ප්‍රතිචාර දැක්වූවන්ගෙන් සැලකිය යුතු ප්‍රතිශතයක් (42.6%) පෙන්නුම් කරනු ලබන්නේ ඔවුන් ඒ පිළිබඳ සෑහීමකට පත් නොවන බවයි.
- ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 40% කට ආසන්න ප්‍රමාණයක් විධායක ජනාධිපති ක්‍රමය සම්පූර්ණයෙන්ම අහෝසි කළ යුතු බවට ප්‍රකාශ කරනු ලබන අතර, විධායක ජනාධිපති ක්‍රමය යම් ආකාරයකින් පවත්වා ගත යුතු බව ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 47% ක් පමණ ප්‍රකාශ කරනු ලබයි.
- ප්‍රතිචාර දැක්වූවන්ගෙන් බහුතරයක් (66.7%) විශ්වාස කරනු ලබන්නේ කිසිදු සිවිල් හෝ අපරාධ නීතිමය ක්‍රියාදාමයකින් අත් වන ප්‍රතිවිපායන්ට මුහුණ නොදීමේ මුක්තියක් ජනාධිපතිවරයාට නොතිබිය යුතු බවයි.
- ප්‍රතිචාර දැක්වූවන්ගෙන් සුළු බහුතරයකගේ (53.5%) මතය වන්නේ මහජන නියෝජිතයන් විසින් තම ජනවාර්ගිකත්වය හෝ ආගම නියෝජනය කිරීම වැදගත් බවයි. මෙම හැඟීම බොහෝ දුරට නිරූපණය වූයේ මුස්ලිම් (71.2%) සහ දෙමළ (51%) ප්‍රජාවන් නියෝජනය කරමින් ප්‍රතිචාර දැක්වූවන් අතරය.
- ප්‍රතිචාර දැක්වූවන්ගෙන් සැලකිය යුතු ප්‍රතිශතයක් (47.3%) ප්‍රකාශ කර සිටින්නේ මෙරට තුළ නීතිය හා සාමය පවත්වාගෙන යන ආකාරය පිළිබඳව තමන් සෑහීමකට පත් නොවන බවයි.
- කාර්ය පටිපාටික යුක්තිය සම්බන්ධයෙන් ගත් කළ, ප්‍රතිචාරකයන්ගෙන් බහුතරයක් විශ්වාස කරනු ලබන්නේ, අපරාධ සහ දූෂණ සම්බන්ධයෙන් වන චෝදනාවන්ට ලක්වූ යම් පුද්ගලයෙකු ආර්ථික වශයෙන් දුප්පත් පසුබිමකට අයත් නම් (57.4%), සුළුතර ආගමික ප්‍රජාවක අයකු නම් (52.4%) හෝ සුළුතර ජනවාර්ගික ප්‍රජාවකට අයත් නම් (53.6%) ඔවුන්ට අධිකරණ පද්ධතියෙන් අසාධාරණ සැලකීමක් සිදුවනු ඇති බවයි.